**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (කු.වැ.ව්‍ය.සං.වැ) - 2013**

---

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කෘෂිකර්මික සංවර්ධන සඳහා වන ජාත්‍යන්තර අරමුදල (කා.සං.ජා.අ) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2007 මැයි 08 දින එළඹි අංක 712 - එල්කේ දරන ණය ගිවිසුමේ v ව්‍යවස්ථාවේ 02 (ඒ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විගණනය කරන ලදී.

1.2 **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය**

---

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ ණය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.වැඩසටහනේ අරමුණු වනුයේ ප්‍රතිලාභීන්ගේ ආයතනික ශක්තිය හා සන්නිවේදන නිපුණතා ශක්තිමත් කිරීම, කුඩා පරිමාණ තේ හා රබර් වගාකරුවන්ගේ ඉඩම් බුක්තිය ඉහළ නැංවීම, වැවිලි කරුවන්ගේ නිෂ්පාදන සඳහා වැඩිදියුණු කළ පසු අස්වනු හැසිරවීමේ ක්‍රම, ගබඩාකරණය, පෙරසැරි කිරීම් හා ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකරණය මගින් නිෂ්පාදන ලාභය ඉහළ නැංවීම, ග්‍රාමීය මූල්‍ය හා ණය සේවාවන් සංවර්ධනය හා ව්‍යාප්ත කිරීම, කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔහුන්ගේ කාල දිළිඳුකම අඩුකිරීම පිළිබඳ සහතික වීමයි.

ණය ගිවිසුමට අනුව වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 22.5 ක් වන අතර එයින් එක්සත් ජනපද ඩොලර් මිලියන 3.8ක්, එක්සත් ජනපද ඩොලර් මිලියන 5.5, ක් එක්සත් ජනපද ඩොලර් මිලියන 5.2, එක්සත් ජනපද ඩොලර් මිලියන 2 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 1 ක් පිළිවෙලින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල, ශ්‍රී ලංකා රජය, එක්සත් ජනපද ජාත්‍යන්තර සහයෝගිතා අරමුදල, වෙල්ලස්ස රබර් සමාගම, සහභාගිත්ව මූල්‍ය ආයතන සහ ප්‍රතිලාභීන්ගේ දායකත්වය මඟින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත.එක්සත් ජනපද ජාත්‍යන්තර සහයෝගිතා අරමුදල සහ වෙල්ලස්ස රබර් සමාගම විසින් අදාළ මූල්‍යයන් නොකිරීම සහ සහාභාගිත්ව මූල්‍ය ආයතන වල දායකත්වය එක්සත් ජනපද ඩොලර් මිලියන 2 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 0.7 දක්වා අඩුකිරීම නිසා වැඩසටහනේ ඉහත ඇස්තමේන්තුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නැවත සංශෝධනය කිරීමට යෝජනා කර තිබුණි. එබැවින් වැඩසටහනේ ඇස්තමේනතුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 28 දක්වා අඩු කර තිබුණි. වැඩසටහනේ කටයුතු 2007 නොවැම්බර් 06 දින ආරම්භ වූ අතර වර්ෂ හතක කාලපරිච්ඡේදයක් තුළ එහි කටයුතු අවසන් කිරීමට නියමිතය.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම්කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම් වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතියෙහි කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් වූ වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය, ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ඇදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම හා එම ගිණුමට කරන ලද ඌනපූර්ණයන් වැඩසටහන මඟින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැං.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරිදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

3. **මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ජේදයෙහි දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක තැන්පතුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහබැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරිදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

4. **මූල්‍ය ප්‍රකාශන**

---

4.1 මූල්‍ය කාර්යසාධනය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහනේ වියදම රු 503,736,264 ක් වූ අතර එම දිනට සමුච්චිත වියදම රු 1,759,899,896 ක් විය. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ වැඩසටහනේ වියදම පිළිබඳ සාරාංශයක් සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්ත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 15,382,670 | 66,354,327 | 183,221,239 |
| මෝටර් රථ | - | - | 32,377,365 |
| උපකරණ සහ භාණ්ඩ | 3,707,482 | 3,031,823 | 19,585,215 |
| පුහුණුව සහ වැඩමුළු | 15,047,179 | 10,406,602 | 43,456,332 |
| තාක්ෂණික අධාර සහ අධ්‍යයනයන් | 1,685,778 | 5,853,510 | 16,945,227 |
| සේවා සැපයුම් කොන්ත්‍රාත් | 8,486,292 | 5,359,273 | 20,560,787 |
| කෘෂිකාර්මික යෙදවුම් | 68,616,617 | 82,346,464 | 336,709,110 |
| සහනාධාර සහ සීහුම් ප්‍රදාන | 121,962,641 | 130,701,016 | 464,894,001 |
| ණය | 164,796,264 | 57,429,736 | 272,536,000 |
| වැටුප් හා දීමනා | 29,504,040 | 27,476,219 | 146,456,988 |
| මෙහෙයුම් හා නඩත්තු | 14,036,072 | 13,999,290 | 81,526,182 |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 19,312,163 | 21,265,461 | 77,747,450 |
| සහභාගිත්ව මූල්‍ය ආයතන (ස.මූ.ආ) වල දායකත්වය | 41,199,066 | 14,357,434 | 61,884,000 |
| සමාජ වගකීම් අරමුදල් | - | - | 2,000,000 |
| එකතුව | 503,736,264 | 438,581,155 | 1,759,899,896 |

4.2 **අග්‍රිම අරමුදල් ගිණුම**

------------------------

වැඩසටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා සහ ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩොලර් | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 7,096 | 902,411 |
| එකතු කළා: | | |
| ඌනපූර්ණයන් | 3,720,153 | 480,084,531 |
| විදේශ විනිමය වාසි | - | 1,813,495 |
| | 3,727,249 | 482,800,437 |
| අඩුකළා : ආපසු ගැනීම් | 3,157,735 | 408,334,713 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 569,514 | 74,465,724 |

5. **විගණන නිරීක්ෂණ**

----------------------

5.1 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ (කු.තේ.සං.අ) නුවරඑළිය ශාඛාවට රු.25,076,966 ක මුදලක් කුඩා තේ වතු හිමියන්ට ආධාර ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු බව වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගිණුම් වලට අනුව එම ප්‍රමාණය රු. 25,302,159 ක් වුයෙන් රු. 225,193 ක වෙනසක් දක්නට තිබුණි. විස්තර පහත දැක්වේ.

| විෂයය | වැඩසටහන අනුව ශේෂය | කු.තේ.සං.අධිකාරියේ ගිණුම්වලට අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු | රු | රු |
| වීපී තේ පැළ | 6,134,490 | 3.255,923 | (2,878,567) |
| පැළ ප්‍රවාහනය | 352,925 | 367,429 | 14,504 |
| සහනාධාර | 17,525,494 | 20,607,706 | 3,082,212 |
| පොහොර | 203,750 | 203,750 | - |

| | | | |
|---|---|---|---|
| ගොවීන් පුහුණු කිරීම | 142,193 | 127,984 | (14,209) |
| සේවා සැපයුම්කරු | 718,114 | 739,367 | 21,253 |
| | ----------- | ------------ | ----------- |
| | 25,076,966 | 25,302,159 | 225,193 |
| | ========= | ========= | ======= |

5.2 **ගෙවීම් කිරීමේ අඩුපාඩු**

(අ) මොණරාගල උප වැඩසටහන සඳහා වටිනාකම රු.7,668,412 ක්, සහතික නොකළ වවුචර් 6 ක් මත ගෙවා තිබුණි.

(ආ) මොණරාගල උප වැඩසටහනෙහි වටිනාකම රු.515,275 ක් වූ වවුචර් 4ක ගෙවීම් ලාභීන්ගෙන් ලද බවට තහවුරු කිරීමේ සාක්ෂි අන්තර්ගතව නොතිබුණි.

5.3 **මතභේදයට තුඩු දියහැකි ගනුදෙනු**

මැදරට උපවැඩසටහන යටතේ වැසි දැල් ආවරණ ඉදිකිරීම සඳහා ගැල්වනයිස් කරණ ලද යකඩ බට මිළට ගැනීමට වැයකර තිබුණු රු.1,135,713 ක වියදම පවත්නා ප්‍රසම්පාදන පිළිවෙත් උල්ලංඝනය කිරීම හේතුවෙන් කෘෂිකාර්මික සංවර්ධන සඳහා ජාත්‍යන්තර අරමුදල විසින් ප්‍රතිපූර්ණය කිරීමට එකඟවී නොතිබුණි. මෙම වියදම අදාළ වගකිව යුතු නිලධාරින්ගෙන් අයකරගැනීමට කටයුතු නොකර ශ්‍රී ලංකා රජයේ දායකයට ලියා හැර තිබුණි.

5.4 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අතුරු බෝග වගාවන් සඳහා කොකෝවා පැළ බෙදා දීම.**

රබර් වගාවට අතිරේකව අතුරු බෝගයක් ලෙස කොකෝවා වගාව දිරීමත් කිරීමේ අරමුණින් මොණරාගල උපවැඩසටහන මඟින් ගොවීන් අතර කොකෝවා පැළ බෙදාහැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. වගාකිරීමේ කාලසීමාව ඉක්මවා ගිය පසු පැළ බෙදා දීම හේතුවෙන් වගාව විනාශවීමත්, ඇතැම් ගොවීන්ට රබර් වගා කර අවුරුදු 3 ක කාලයක් ඉක්මයාමට පෙර පැළ බෙදාදීම නිසා වගාවට අවශ්‍ය සෙවන රබර් පැළ වැඩීම මඟින් නොලැබී යාම නිසාත් වැඩසටහන අසාර්ථක වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) **ප්‍රතිලාභීන් අතර බෙදාහැරීම සඳහා රබර් පැළ මිලට ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මොණරාගල උපව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන් අතර බෙදා හැරීම සඳහා එලිපන්ගමුව පැළතවානද ඇතුළත්ව පෞද්ගලික පැළ තවාන් කීහිපයකින් රබර් පැළ 253,921 ක් මිළට ගෙන තිබුණි. වාරක පරික්ෂණයකව අනුව, එලිපන්ගමුව පැළතවාන මඟින් රබර් පර්යේෂණ ආයතනයට රබර් පැළයක් රු.60 බැගින් විකුණා තිබූ බව අනාවරණය විය.එසේ වුවත් වැඩසටහන මඟින් ඊට සමාන රබර් පැළයක් රු.85 බැගින් මිළට ගැනීමනිසා රබර් පැළයක් සඳහා රු.25 ක් වැඩියෙන් ගෙවා තිබූ අතර වැඩසටහන මඟින් වැඩිපුර දරා තිබුණු මුළු මුදල රු.6,348,025 ක් විය.

(ii) රබර් පැළයක් ප්‍රවාහනය කිරීමට ඇති දුර පදනම් කරගෙන ඒ සඳහා රු.18 ත් 20 ත් අතර ගෙවීමට එකඟවී තිබුණද ඉහත එකඟවූ මුදලට අමතරව රු.2,819,671 ක් ප්‍රවාහනය සඳහා ගෙවා තිබුණි. මේ අනුව, රබර් පැළයක සමාන්‍ය මිළ දළ වශයෙන් රු.104 ක් වී තිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කරන ලද බෙදාහැරීමේ ලැයිස්තු වලට අනුව ප්‍රතිලාභීන් අතර රබර් පැළ 253,921 බෙදා හැර තිබුණි. එසේ වුවත්, හැඳුනුම්පත්, ලිපිනයන් ලබා ගත් අයගේ අත්සන්, බෙදාදුන් නිලධාරින්ගේ අත්සන් නොමැති වීම සහ එකම පුද්ගලයෙකු වෙනත් පුද්ගලයන්ගේ නම් ඉදිරියෙන්ද අත්සන් තබා තිබුණු අවස්ථාවන් තිබීම, යනාදී කරුණු හේතුවෙන් මෙකී පැළ අදාළ ප්‍රතිලාභීන් අතර නියමිත පරිදී බෙදාදී ඇති බව තහවුරු නොවිණි.

5.5 **ආර්ථික නොවන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **පරිගණක මිලදී ගැනීම**

මොණරාගල වැඩසටහනෙහි ප්‍රයෝජනය සඳහා එක්සත් ජනපදයෙහි නිෂ්පාදනය කරන ලද දත්ත පෙරසැරි කිරීමේ වේගය 2.3 GHZ සහිත ඩෙල්වර්ගයේ ලැප් ටොප් පරිගණක දෙකක් එකක් රු.120,250 බැගින් මිලට ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. එසේ වුවත් මහජන චීනයේ නිෂ්පාදිත දත්ත පෙරසරි කිරීමේ වේගය 1.6 GHZ සහිත ඩෙල් වර්ගයේ පරිගණක දෙකක් එම මිලට මිලටගෙන තිබුණි.මෙයට සමාන පරිගණකයක් විවෘත වෙළඳපොලේ රු.65,000 ක් වන බැවින් මෙම ප්‍රසම්පාදනය සඳහා රු.102,500 ක් වැඩිපුර ගෙවා ඇති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) **අතුරු වගාවන් සඳහා බඩ ඉරිඟු ඇට මිලට ගැනීම**

(i) මොණරාගල උපවැඩසටහන මඟින් මුළු පිරිවැය රු.3,489,420 ක් වූ දෙමුහුන් බඩ ඉරිඟු ඇට පැකට් 933 ක් පැකට්ටුවක් රු.3,740 බැගින් 2013 ඔක්තෝබර් මාසයේදී මිලට ගෙන තිබුණද මෙකී බීජ ඇට දඹගල්ල කෘෂි සේවා මධ්‍යස්ථානය විසින් පැකට්ටුවක් රු.3,650

බැගින් මෙම සමාගමෙන්ම මිලට ගෙන තිබූ බව වාරක පරික්ෂාවකදී අනාවරණය විය. මේ අනුව වැඩසටහන මගින් පැකට්ටුවකට රු.90 බැගින් රු.83,970 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) රු.374,000 ක් වටිනා පැකට් 100 ක් ගොවීන් අතර බෙදාදීමට අදාළ ලිඛිත සාක්ෂි කාර්යාලයෙහි නොවීය. බීජ පැළවීමේ ප්‍රතිශතය හා බෝග අස්වැන්න පිළිබඳ පරීක්ෂාවකින් තොරව සැපයුම්කරුගේ කාර්ය සාධන බැඳුම්කරය මුදාහැර තිබුණි.

5.6 **විගණනය සඳහා නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල ලිඛිත සාක්ෂි |
|---|---|---|
| (අ) ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට ගෙවීම | 776,142 | සහභාගිකයන්ගේ පැමිණීමේ සටහන් හා වියදම් සනාථ කිරීමේ බිල්පත් |
| (ආ) දොරගල වැව ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට කළ ගෙවීම් | 193,434 | ප්‍රමාණ බිල්පත්, වැඩ අවසන් කිරීමේ සහතික සහ වියදම් සනාථ කිරීමේ බිල්පත් |

5.7 **නිෂ්කාර්ය වියදම්**

(අ) විධිමත් තාක්ෂණ ඇගයීමක් සිදුනොකර මැදරට උපවැඩසටහන මඟින් රු.490,000 ක මුදලකට යෝගට් භාජන මුද්‍රා තැබීමේ යන්ත්‍රයක් මිලට ගෙන එළකිරි වලින් යෝගට් නිෂ්පාදනය කිරීම සඳහා 2013 ජුනි 26 දින ප්‍රතිලාභිකයෙකුට ලබාදී තිබුණු අතර සම්පූර්ණ ස්වයංක්‍රීය යත්ත්‍රයක් වෙනුවට අර්ධ ස්වයංක්‍රීය යන්ත්‍රයක් සපයා තිබුණි. අතිරේක ශ්‍රම පිරිවැයක් දැරීමට සිදුව තිබීම නිසා ප්‍රතිලාභියා විසින් නිෂ්පාදන කටයුතු 2014 අගෝස්තු 10 දින දක්වාම ආරම්භ කර නොතිබුණි.

(ආ) පිරිවැය රු.1,103,220 ක් වූ අධිධාරිතාවයකින් යුතු ගම්මිරිස් වියලීමේ යන්ත්‍රයක් ගම්මිරිස් පලදාව බහුලව පවතින අරනායක සුපුනි ඇල්ල ප්‍රදේශයේ ගම්මිරිස් වියලීම සඳහා ප්‍රතිලාභිකයෙකුගේ නිවසෙහි 2013 අගෝස්තු 01 දින සවිකර තිබුණි. යන්ත්‍රය ක්‍රියාකරවීමට අවශ්‍ය ඉන්ධන පිරිවැය හෝ ආවරණය කර කරගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ලබාගත නොහැකිවීම නිසා 2014 අගෝස්තු 10 දින දක්වාම යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි

6. **කාර්යසාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහනේ කටයුතු 2007 නොවැම්බර් 06 දින ආරම්භ කළ අතර 2014 නොවැම්බර් 06 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2013 දෙසැම්බර් 31 දින සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.3,119,780,000 ක් වූ අතර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ සංශෝධිත පිරිවැය ඇස්තමේන්තු වූ රු.2,697,563,000 න් සියයට 44.4 ක් සහ ශ්‍රී ලංකා රජයේ (ශ්‍රී.ලං.ජ) ඇස්තමේන්තුගත දායකත්වය වූ රු.292,225,000 ක මුදලින් සියයට 59.1 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම උපයෝජණය කර නොතිබුණි.

(ආ) වැඩසටහනේ මැදරට උපවැඩසටහන මඟින් පුහුණු වැඩසටහන් 183 ක් සමාලෝචිත වර්ෂය තුළදී පැවැත්වීමට රු.8,475,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණද වර්ෂය අවසානය දක්වා පුහුණු වැඩසටහන් 44 ක් හෙවත් සියයට 24 ක් පමණක් පවත්වා තිබුණි. මේ අනුව, ඇස්තමේන්තුගත මුදලින් රු.4,624,000 ක් හෙවත් සියයට 54 ක් උපයෝජනය කර නොතිබුණි.